ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම - 2020
-----------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් ශේෂය රු. 27,075,878 ක් වූ ස්ථාවර වත්කම්වල ඇතුළත් රු.8,290,423 ක් වූ වත්කම් සඳහා මිලදී ගත් වර්ෂය සඳහන්ව නොතිබුණි. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව එකී වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය දක්වා ක්ෂය කිරීම් සිදු කර නොතිබූ බැවින් වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වසරේදී එම වත්කම් වල අගයන් නැවත හඳුනාගෙන ඒවා පොත්වලට ගැනීමට හෝ නොගැනීමට අදාල නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරමි. | ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදිව ක්ෂය කිරීම් සිදුකළ යුතුවේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2020 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල්වලට සමාන දෑ රු. 4,575,531 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගය රු.2,575,531 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.2,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස රජයේ ප්‍රදාන ලෙස ලද රු.2,000,000 ක | 2020-12-31 දිනට අදාල මිලියන 02 මුදල මුදල් හා මුදල්වලට සමාන දෑ තුල ගලපා ඇත. | අදාළ මුදල් ප්‍රවාහ නිසි පරිදි ගිණුම්ගත කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් යටතේ දක්වා නොතිබීම නිසා සිදුවී තිබුණි. | | |
| **ii.** 2020 වර්ෂයේදී සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී රු.1,400,559 ක් වටිනා අයිතම 86 ක් පොත් ශේෂයට වඩා වැඩියෙන් දැක්වුණු අතර, රු.244,631 ක් වටිනා අයිතම 51 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වසර අවසානයේදී සිදුකල භාණ්ඩ සමීක්ෂණයේදී පොත්වලට නොගෙන තිබූ නමුදු ඉදිරියේදී නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට හෝ ඉවත් කිරීම සඳහා කටයුතු කිරීම පිණිස අදාල තොග සමීක්ෂණ මණ්ඩලය පොත් වලට ගෙන තිබුණි. | භාණ්ඩ සමීක්ෂණ නිසි පරිදි සිදු කර පොත්වල ගැලපීම් කළ යුතුවේ. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රු. | | |
| **i.** 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය (ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 60 වගන්තිය | වාහන සේවා කටයුතු සිදුකරන ආයතන විසින් ඊට අදාලව බලපත්‍රයක් ලබාගත යුතු වුවද, සමාගම2020 දෙසැම්බර් 31දින වන ලබා විටද එම බලපත්‍ර කිසිඳු ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල නීති රීති වලට අනුකූලව කටයුතු කරමි. | අදාළ පාරිසරික නීති රීති වලට අනුව කටයුතු කළ යුතුවේ. |
| **ii.** 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 60 වගන්තිය | සමාගමක් ආදායම් බදු ගෙවීම සඳහා නීතියෙන් බැඳී සිටින අතර, සමාගම 2020 දෙසැම්බර් 31 විගණිත දින දක්වා අදාල අවශ්‍යතාවය සපුරාලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී අදාල නීති රීති වලට අනුකූලව කටයුතු කරමි. | දේශීය ආදායම් පනතට අනුව බදු වගකීම සිදුකළ යුතුවේ. |
| **iii.** 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාරය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දිරිදීමනා යෝජනා ක්‍රමයක් පවත්වා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය | ඉදිරියේදී අදාල නීති රීති වලට අනුකූලව කටයුතු කරමි. | දිරි දීමනා ගෙවීම භාණ්ඩාගාර අනුමැතියන් ඇතිව නිවරදි ඇගයීම් ක්‍රමයක් යටතේ සිදුකළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | තුලදී දිරිදීමනා වශයෙන් රු.**1,839,840** ක මුදලක් ගෙවා තිබුණි . එසේම මෙම වටිනාකම තුල ඇතුලත් රු. **795,600** ක දිරි දීමනාවක් කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණු අතර එහිදී අපේක්ෂිත කාල ඉලක්කය සපුරා නොතිබියදී මෙම ගෙවීම් සිදුකර තිබුණි. | | |
| **iv. 2000** අංක **33** දරන කර්මාන්තශාලා ආඥාපනත **39 (1)** වගන්තිය | කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ට එක් එක් අවස්ථාවලදී ගින්නක් ඇතිවූ විට යුක්ති සහගතව අවශ්‍යවිය හැකි බේරීමේ මාර්ග සපයා තිබිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල නීති රීති වලට අනුකූලව කටයුතු කරමි. | කර්මාන්ත ශාලා පනතේ දක්වා ඇති පියවර ගත යුතුවේ. |
| **42** අ **(1)** වගන්තිය | සෑම කර්මාන්තශාලාවකම ගිනි නිවන උපකරණ ඒ සඳහා සාදන ලද නියෝගවලට අනුකූලව සපයා තිබිය යුතු නමුත් සමාගම විසින් මෙම කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | ඉදිරියේදී අදාල නීති රීති වලට අනුකූලව කටයුතු කරමි. | කර්මාන්ත ශාලා පනතේ දක්වා ඇති පියවර ගත යුතුවේ. |
| **v. 2006** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය **3.2** වගන්තිය | සමාලෝචිත වර්ෂය තුලදී බස් රථ අළුත්වැඩියා කටයුතු සඳහා රු.**74,935,429** ක් වටිනා අමතර කොටස් පුද්ගලික සමාගම් වෙතින් මිළදී ගෙන තිබූ අතර ඒ සඳහා ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවා | ඉදිරියේදී අදාල නීති රීති වලට අනුකූලව කටයුතු කරමි. | අදාල ද්‍රව්‍ය මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සිදුකළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | මිළ ගණන් ඇගයීමට කටයුතු කර නොතිබුණි. | | |
| 3.4.3 වගන්තිය | දැන්වීම් පල කිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමින් යුතු අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිතා වන එක් එක් අයිතමයන් මිළදී ගැනීම සඳහා අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදු කර එසේ භාණ්ඩ හා සේවා සැපයීමට හැකි සැපයුම්කරුවන්ගේ නම් ඇතුලත් ලැයිස්තුවක් පිළියෙල කරනු ලැබිය යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල නීති රීති වලට අනුකූලව කටයුතු කරමි. | අදාල ද්‍රව්‍ය මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සිදුකළ යුතුවේ. |
| 4.2 වගන්තිය | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියල කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල නීති රීති වලට අනුකූලව කටයුතු කරමි. | අදාල ප්‍රසම්පාදන සැලසුම් චක්‍රලේඛ ප්‍රකාරව සිදුකළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

**සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 26,326,283 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.23,956,337 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 50,282,620 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් ආදායම රු. 57,275,145 ක ප්‍රමාණයකින් අඩුවීම හා විකුණුම් පිරිවැය පෙර වර්ෂයට සාපේක්ෂව රු.5,415,376 කින් පමණක් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය
--------------------------------------------------------------------

- **සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 31 කින් අඩුවී ඇති අතර විකුණුම් පිරිවැය සියයට 5 ක ප්‍රතිශතයකින් අඩුවී තිබුණි.**

- **සමාගමේ සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායම් වටිනාකම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 80 කින් අඩුවී ඇත.**

## 2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 0.30 වූ අතර එය ඉකුත් වර්ෂයේ අනුපාතය වන 0.25 ක් විය.

- සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 5 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ අනුපාතය වන සියයට 31 ට සාපේක්ෂව සියයට 26 කින් අඩු වී තිබෙන බව නිරීක්ෂණය වේ. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් විකුණුම් පිරිවැය වැඩිවීම බලපා ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ බස් රථ 106 ක් අලුත්වැඩියාව සඳහා වැඩ බිමට ඇතුලත් කර තිබුණද, ඉන් බස් රථ 27 ක කිසිදු අලුත්වැඩියාවක් 2021 මාර්තු 18 දින වන තෙක් සිදු නොකර මාස 03 සිට මාස 09 ක් දක්වා කාලයක් වැඩබිමේ ගාල්කර තිබුණු අතර, එය අලුත්වැඩියාවට ලද බස් සංඛ්‍යාවෙන් සියයට 25 ක් විය. ඉතිරි බස් රථ 79 හි අලුත්වැඩියා අවසන් කර තිබුණද, ඒ සඳහා මාස 02 සිට අවු:01 දක්වා කාලයක් වැය කර තිබූ අතර අදාල අලුත්වැඩියා කටයුතු සඳහා ශ්‍රමය කොන්ත්‍රාත් පදනමින් ලබාගෙන තිබුණි. | 2021 වසරේ සිට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් ප්‍රමාද කරන සෑම දිනකට රු.1,000 බැගින් ප්‍රමාද ගාස්තු අයකරනු ලැබේ. | කොන්ත්‍රාත් නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන අංශයේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන බින්කාඩ් පත් යාවත්කාලීන නොකිරීම සහ නිතරම භාවිතයට ගැනෙන ද්‍රව්‍යයන් වෙනුවෙන් තොග මට්ටම් පවත්වාගෙන යාම නොසලකා හැර ආරක්ෂක තොග (buffer stock) මට්ටම් නොමැතිවීම තුල ක්ෂණික මිලදී ගැනීම් රු.38,348,373 ක් පමණ වී තිබූ අතර එය මුළු මිලදී ගැනීම් සියයට 80 කින් වැඩිවීමට මෙම ක්ෂණික මිලදී ගැනීම් හේතුවී තිබුණි. තවද බින්කාඩ් පත්‍ර පරීක්ෂාවේදී දැනට භාවිතා නොවන අයිතම 90 ක තොගයක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වසර ඇතිවූ වසංගත තත්වයන් මත ඇති වූ මූල්‍ය දුෂ්කරතා මත නිසි ලෙස ආරක්ෂාකාරී තොග පවත්වාගෙන නිෂ්පාදන කටයුතුද පවත්වාගෙන යාමට නොහැකි වූ අතර, ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | නිවරදි තොග පාලන මට්ටම් පවත්වා ගැනීම හා නිසි පරිදි බින් කාඩ් පවත්වා ගත යුතුවේ. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| i. | 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත කාර්යය මණ්ඩලය 121 ක් වූ අතර, ඉන් සේවකයන් 96 ක් ස්ථිර පදනම මතද, 12 ක් කොන්ත්‍රත් පදනම මතද, බඳවා ගෙන තිබුණි. සමාගමේ ප්‍රධාන කළමනාකරණ තනතුර වූ සාමාන්‍යාධිකාරී තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුල නොවූ අතර, කර්මාන්තශාලා ඉංජිනේරු තනතුරද කොන්ත්‍රාත් පදනමෙන් බඳවා ගෙන තිබුණි. සමාගමේ වැඩ මූලික (ෆෝමන්) තනතුරු 06 ක් අනුමතව පැවතියද, ඉන් 03 ක් 2021 පෙබරවාරි දක්වා පුරප්පාඩුව පැවතුණි. | සමාගම් අනුමත කාර්යය මණ්ඩලයට අදාල බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වූ විගස සමාගමේ මූල්‍ය තත්වයට උචිත ලෙස අදාල බඳවා ගැනීම සිදු කරමි. | අදාල තනතුරුවල පුරප්පාඩු නියමිත පරිදි පිරවීම් කළ යුතුවේ. |
| ii. | කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අංක: ඩීඑම්එස්/1623 හා 2018 ඔක්තෝබර් 03 දිනැති ලිපිය අනුව සමාගමේ නව සේවක ව්‍යුහය සඳහා අනුමැතිය ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද බඳවා ගැනීම් පරිපාටිය සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021වසරේදී බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීමට කටයුතු කරමි. | බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර අනුමත කරගත යුතුවේ. |
| iii. | සමාගම තනතුරු 04 ක් සඳහා දීර්ඝ කාලීනව ආවරණ පත්වීම් ලබාදී තිබුණු අතර, ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, අනුමත කම්කරුවන් ගණන 20 ක් වුවද, තත්‍ය කම්කරුවන් ගණන 62 ක් වූ බැවින් 42 ක් අනුමත සංඛ්‍යාව ඉක්මවා යොදවා තිබුණි. | | අදාල පත්වීම් සඳහා ස්ථිර බඳවා ගැනීම් නිසි පරිදි සිදුකළ යුතුවේ. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති හා අංක: පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සමාගමේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 3 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුුතු වුවත්, සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කළ යුතුවේ. |